(1) IM Japan ආයතනය පිළිබඳව

නම : IM Japan (Public Interest Foundation) International Manpower Development Organization, Japan

IM Japan (මහජන අවශ්‍යයතා සංස්ථාගත පදනම) ජාත්‍යයන්තර මානව සම්පත් සංවර්ධන සංවිධානය.

ප්‍රධානියා : සභාපති Mr. Kanamori Hitoshi

මූලස්ථානය පිහිටි ස්ථානය : 7th Floor, Nihonbashi Horidome-cho Nichome Bldg, 2-4-3, Nihonbashihoridome- cho, Chuo-ku, Tokyo, 103-0012, Japan

ශාඛා : ජපානය තුළ ශාඛා 15ක් හා ඉන්දුනීසියාව, තායිලන්තය, වියට්නාමය, බංගලාදේශය හා ශ්‍රී ලංකාව යන රටවල ශාඛා 5ක් සහිතය.

ස්ථිර සේවක ප්‍රමාණය : 318කි. (2022 / 03 වන මස සිට මේ දක්වා )

වෙබ් අඩවිය : https://www.imm.or.jp/en/

(ඉහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසීමෙන් IM Japan වැඩසටහන පිළිබඳව හා ජපානය තුළ පුහුණුව ලබන පුහුණු ලාභීන්ගේ විස්තර දැක බලාගත හැක. )



(2)IM Japan ආයතනයේ කාර්යභාරය (විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් බඳවාගැනීම පිළිබඳ කටයුතු)

IM Japan (මහජන අවශ්‍යායතා සංස්ථාගත පදනම) ජාත්‍යයන්තර මානව සම්පත් සංවර්ධන සංවිධානය, ඉහත සඳහන් රටවල රජයන් හා අත්සන් කරනු ලැබූ අවබෝධතා ගිවිසුමට (MOU) අනුව 1993 මැයි මස සිට විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් බඳවාගැනීම සිදු කරනු ලබයි. දිනෙන්දින බඳවාගැනීම් ප්‍රමාණය වර්ධනය වෙමින් පවතින අතර වර්තමානය වනවිට ඉහත සඳහන් සෑම රටකම රජය විසින් තෝරා ගනු ලැබූ 60,000 පමණ විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් ප්‍රමාණයක් බඳවාගෙන තිබේ. වර්තමානය වන විට සාමාජික සමාගම් 1,900 ක් පවතින අතර තාක්ෂණික පුහුණුලාභීන් 9,000 ක් බඳවාගෙන ඇත.(2021 මාර්තු මස අවසානයේ සිට මේ දක්වා)

IM Japan ආයතනය, විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් ජපානයට පිටත් කරනු ලබන රජයන්ට පෙර විගමනික පුහුණුව ලබාදීමට අදාල සහයෝගය ලබාදීම, ජපන් භාෂා ගුරුවරු බඳවාගැනීම සඳහා සහයෝගය ලබාදීම, තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභී භාරකාර ආයතන මගින් තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ සඳහා සහය ලබාදීම, ජපානයට යෑමෙන් අනතුරුව පසු විගමනික පුහුණුවක් ලබා දීම, බඳවාගැනීමෙන් අනතුරුව සේවාස්ථ පුහුණුව ලබන ආයතනය පිළිබඳව, ජපන් ජීවනරටාව පිළිබඳව හා නීතිරීති පිළිබඳව මනා පුහුණුවක් සහිත නිලධාරීන් පිරිසක් විසින් පැහැදිලි කිරීම හා භාරගන්නා ආයතනයට අදාළ සහයෝගය ලබා දීම යනාදී කටයුතු සිදුකරනු ලබයි. IM Japan ආයතනය, "තම රටේ සමාජීය හා නිෂ්පාදන අංශයේ සංවර්ධනය හා සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනය සඳහා දායකවීම" අරමුණු කරගනිමින් ජාත්‍යාන්තර වශයෙන් මානව සංවර්ධනය සඳහා දායකවී සිටියි.

විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් බඳවාගැනීමට අමතරව විදෙස් රටවල ජපන් ආයතන ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම හා තරුණ පිරිස් සඳහා වන හුවමාරු වැඩසටහන් සිදු කරනු ලබයි.

(3) ශ්‍රී ලාංකික තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් බඳවාගැනීම පිළිබඳ කටයුතු(IM Japan)

IM Japan ආයතයනය 2017 ශ්‍රී ලංකා රජය (විදේශ රැකියා අමාත්‍යාංශය හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය) හා අත්සන් තැබූ අවබෝධතා ගිවිසුමට（MOU） අනුව 2018 මැයි මස සිට වර්තමානය දක්වා 382 ක් පමණ තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් ප්‍රමාණයක් බඳවාගෙන ඇත.

වසර 5ක හෝ වසර 3ක කාලයක් තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභී වීසා සහිතව ජපානයේ ජීවත් වෙමින් භාරකාර ආයතනයෙන් ලබා දෙන රැකියාවේ හා කටයුතුවල නිරත වන අතර (ON THE JOB TRAINING) එම කාලය තුළදී ජපානයේ තාක්ෂණය, රැකියාවක නිරත වන ආකාරය හා නිෂ්පාදනයක තිබිය යුතු තත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබා තම රටට ආපසු පැමිණ තම රටේ සංවර්ධනයට දායක වියහැකි ආකාරයේ මානව සම්පතක් බිහිකිරීම සඳහා කටයුතු සිදු කරමින් සිටී. අලුතින් මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබූ බංගලාදේශය හා ශ්‍රී ලංකාව හැර අනෙකුත් රටවල 7,000කට අධික පුහුණුලාභීන් පිරිසක් තාක්ෂණික සේවාස්ථ පුහුණුව අවසන්කර තම මව් රටට ආපසු ගොස් තම ප්‍රදේශයේ තරුණ පිරිස් සඳහා ජපානයේදී උගත් තාක්ෂණය ලබා දෙමින් සිටී.

2019 ජූනි මස වනවිට IM Japan ආයතනය පුහුණුලාභීන් භාරගැනීමේ විශිෂ්ට ආයතනයක් ලෙස පිළිගෙන ඇති අතර විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් සඳහා වන තාක්ෂණික පුහුණු ආයතනය (OTIT) මගින් වසර පහක කාලයක් සඳහා සේවාස්ථ තාක්ෂණික පුහුණුකරුවන් යොමු කළ හැකි විශේෂ අවසරයක් ලද ආයතනයක්ද වේ. තවද , IM Japan ආයතනය මඟින් තාක්ෂණික පුහුණුලාභීන් බඳවා ගනු ලබන එක් එක් රටවල්හි රජයන්ගෙන් කෙරෙන ඉල්ලීම් මත IM Japan ආයතනය මඟින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා සහභාගී වීමට පෙර රැකියා අත්දැකීම් (තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් ලෙස ජපානයේදී අත්දැකීම් ලබා තිබීම හා රැකියාවට අදාල වන්නා වූ අත්දැකීම්) අවශ්‍ය නොවේ. හුදෙක් රැකියා සඳහා වන ආශාව කැමැත්ත සහ දැනුම පමණක් ඇති තරුණ තරුණියන් විශාල ප්‍රමාණයකට තාක්ෂණික පුහුණු අවස්ථා සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දී ඇත.

（※විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් සඳහා වන තාක්ෂණික පුහුණු ආයතනය（"OTIT（Organization for Technical Intern Training"）යනු, විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන්ගේ කුසලතා, ශිල්පීය ක්‍රම හෝ දැනුම ලබා ගැනීම, පුහුණුලාභීන්ගේ ප්‍රවීණතාවය හෝ ප්‍රවීණත්වය පිළිබඳව සලකා බලමින් තාක්‍ෂණික පුහුණුව නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හා පුහුණුලාභීන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කරනු ලබන ආයතනයයි. තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් සඳහා වන තාක්ෂණික පුහුණු සැලසුම් සකස් කිරීම, පුහුණුලාභීන් පාලනය කරනු ලබන ආයතන නියාමනය, භාරකාර ආයතනය හා තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් අධීක්ෂණය, සුබසාධනය හා සහයෝගය ලබාදීම ආදී කටයුතු සිදුකරනු ලබයි)







(4) IM Japan තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභියකු සතු වගකීම් හා අයිතිවාසිකම්.

【වගකීම් (උදාහරණ)】

▪මෙම වැඩසටහනට ඇතුලත් වීම සඳහා කිසියම් පුද්ගලයකුට මුදල් ගෙවීමක් හෝ ත්‍යාග වශයෙන් යම් දෙයක් ලබාදීම නොකළයුතුය. (ඒ බව තහවුරු වුවහොත් එම අවස්ථාවේදීම එම පුද්ගලයා ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.)

▪පෙර විගමනික පුහුණුව මාස 4ක් හා පසු විගමනික පුහුණුව මාස 1කි. මෙම පුහුණු කාල තුළ පැවැත්වෙන පරීක්ෂණ සමත් විය යුතුය. (ප්‍රමාණවත් ළකුණු මට්ටම්වලට ළගා නොවුණහොත් වැඩසටහනින් ඉවත්කරනු ලැබේ.)

▪තමා පුහුණුව ලැබූ ආයතනයේදී ලබාගත් දැනුම, කුසලතා, ආකල්ප තම මව් රටට ආපසු පැමිණීමෙන් අනතුරුව ප්‍රයෝජනයට ගනිමින් කටයුතු කිරීම හා එම අරමුණ සහිතව පුහුණු කාලය තුළ කටයුතු කිරීම.

▪ජපන් රජය විසින් පනවා ඇති නීතිරීති (කම්කරු නීතිය, තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභියකු සතු නීතිය, ආගමන විගමන නීතිය ආදී), තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභී භාරකාර ආයතනය විසින් පනවා ඇති නීතිරීති (රැකියා ගිවිසුමට අදාළ ), විදේශ සේවා නියුක්ති කාර්යාංශ දිවුරුමට අදාළ නීතිරීති හා IM Japan මගින් පනවා ඇති නීතිරීති ආරක්ෂා කිරීම.

▪තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් සඳහා වන විභාග සමත්වීම.(පළමු, තෙවන හා පස්වන වසරවලදී විභාග පැවැත්වේ. 1වන වසරෙහි ප්‍රායෝගික හා ලිඛිත පරීක්ෂණය ද 3වන වසරෙහි ප්‍රායෝගික පරීක්ෂණය ද සමත්වීම අනිවාර්ය වේ. )

▪සාත්තු සේවයේ නිරත වන තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් ,ජපන් භාෂා ප්‍රවීණතා විභාගයෙන් සමත්විය යුතුය.(පළමු වසර තුළදී ජපන් භාෂා ප්‍රවීනතා විභාගයේ N3 විභාගය සමත්වීමට කටයුතු කිරීම.)

▪අමතර රැකියාවල නිරත වීම තහනම්.

▪අසත්‍ය වාර්තා ඉදිරිපත් කිරීම තහනම්.

▪රජයට ගෙවිය යුතු බදු මුදල්/රක්ෂණ මුදල්ගෙවිය යුතුය

▪තාක්ෂණික පුහුණුවට බලපාන සෑම සිදුවීමක් පිළිබඳවම අදාළ පුද්ගලයන් දැනුවත් කළ යුතුය, ලබාදෙන සෑම තොරතුරක්ම නිවැරදි විය යුතුය.

▪සොරකම් කිරීම, පුද්ගල ආරවුල් හා තුවාල සිදුකිරීම, අපරාධවල නිරත වීම, සූදුකෙලීම, ආදී කටයුතුවල නිරත නොවිය යුතුය. (යම් කිසි හෙයකින් එවැනි ක්‍රියාවක නිරතවූ බව තහවුරු වුවහොත් තාක්ෂණික පුහුණුව අවසන් කිරීමට කටයුතු කරන අතර සිදුවූ අලාභය අයකරගනු ලැබේ.)

▪වසර 5ක වැඩසටහන සඳහා සහභාගීවන පුද්ගලයන් වසර 3ක පුහුණුව අවසන් වීමෙන් අනතුරුව මාසයකට වැඩි කාලයක් තම මව් රටට පැමිණිය යුතුය. (භාරකාර ආයතනය විසින් වියදම් දරනු ලබයි.)

【අයිතිවාසිකම්(උදාහරණ)】

- ජපානයට යෑම හා ශ්‍රී ලංකාවට ආපසු පැමිණීම සඳහා වන ගුවන් ටිකට්පත් වියදම් භාරකාර ආයතනය විසින් දරනු ලබයි.
- මාස 4ක පෙර විගමනික පුහුණුව සඳහා වන අධ්‍යාපන වියදම්, නවාතැන්,ජල,විදුලි වියදම් ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය විසින් දරනු ලැබේ.
- මාස 1ක පසු විගමනික පුහුණුව සඳහා වන අධ්‍යාපන වියදම්, නවාතැන්,ජල,විදුලි වියදම් ක්‍රියාත්මක කරන සංවිධානයන්(වෘත්තිකයන්)විසින් දරනු ලබයි.
- ජපානයට යෑමෙන් අනතුරුව පවත්වන මසක පසු විගමනික පුහුණු කාලය තුළදී ලබාදෙනු ලබන දීමනාව යෙන් 80,000 කි. (ආහාරපාන හා තම පෞද්ගලික වියදම් තමාට දැරීමට සිදුවේ.)
- 1 වසර තුළ සහතික කළ අතට ලැබෙන මුදල … මාසයකට යෙන් 100, 000 වඩා වැඩි(මූලික වැටුපෙන් රජයට ගෙවිය යුතු බදු මුදල්, නවාතැන්,ජල,විදුලි,ගෑස් ආදී වියදම් හැර අතට ලැබෙන මුදල)
- 2 වසර තුළ සහතික කළ අතට ලැබෙන මුදල … මාසයකට යෙන් 105,000 වඩා වැඩි(මූලික වැටුපෙන් රජයට ගෙවිය යුතු බදු මුදල්, නවාතැන්,ජල,විදුලි,ගෑස් ආදී වියදම් හැර අතට ලැබෙන මුදල)
- 3 වසර තුළ සහතික කළ අතට ලැබෙන මුදල … මාසයකට යෙන් 110,000 වඩා වැඩි(මූලික වැටුපෙන් රජයට ගෙවිය යුතු බදු මුදල්, නවාතැන්,ජල,විදුලි,ගෑස් ආදී වියදම් හැර අතට ලැබෙන මුදල)
- ගොඩනැඟිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සාත්තු සේවිකා රැකියා ක්ෂේත්‍රය සඳහා පමණක් 1 වන වසර තුළ සහතික කළ අතට ලැබෙන මුදල අවම වශයෙන් මාසිකව ජපන් යෙන් 105,000 වන අතර 2 වන වසර තුළ සහතික කළ අතට ලැබෙන මුදල අවම වශයෙන් මාසිකව ජපන් යෙන් 110,000 වේ.3 වන වසරෙහි සහතික කළ අතට ලැබෙන මුදල අවම වශයෙන් මාසිකව ජපන් යෙන් 120,000 ක් වේ.
- සෞඛ්‍ය රක්ෂණය, සේවකයින්ගේ හදිසි අනතුරු රක්ෂණය, රැකියා රක්ෂණය යන රක්ෂණවලට ඇතුළු වීම.
- තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් සඳහා වන අරමුදලට ඇතුල්වීම. (මූල්‍යමය වියදම් භාරකාර ආයතනය විසින් දරනු ලබයි. ඇතැම් ලෙඩරෝග, තුවාලවීම්, මරණ ආදිය සඳහාවන රක්ෂණයකි)
- IM Japan නිලධාරීන්, උපදේශකවරු හා විදේශීය තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් සඳහා වන තාක්ෂණික පුහුණු ආයතනය (OTIT) සමඟ තම මව් භාෂාවෙන් සාකච්ඡා කළ හැකි වීම.
- වසර 3 ක පුහුණු කාලය අවසන් කර මව් රටට ආපසු පැමිණීමෙන් අනතුරුව තම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා වන ව්‍යාපාර දිරි දීමනාව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ලබා දෙනු ලැබේ.(යෙන් 600,000 මුදලක් රුපියල් වලට හරවා ගෙවීම සිදුකරයි.)
- වසර 5 ක පුහුණු කාලය අවසන් කර මව් රටට ආපසු පැමිණීමෙන් අනතුරුව තම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා වන ව්‍යාපාර දිරි දීමනාව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ලබා දෙනු ලැබේ. (යෙන් 1,000,000 මුදලක් රුපියල් වලට හරවා ගෙවීම සිදුකරයි.)
- ජපානයේදී තමා විසින් ගෙවනු ලැබූ සුභසාධන විශ්‍රාම වැටුප් ආපසු ලබා ගැනීම. (තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභියා තම රටට ආපසු පැමිණීමෙන් අනතුරුව අදාළ ලිපිලේඛන සකස් කළ යුතුය)
- පුහුණු කාලය අවසන්වීමෙන් අනතුරුව අවසන් කිරීමේ සහතික පත්‍රය ලැබීම.
- තම රටට ආපසු පැමිණීමෙන් අනතුරුව රැකියාවක් සොයාගැනීමට හා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය සහයෝගය විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ලබා දේ.

## තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභී අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම්.

- අවුරුදු 18ට වැඩි 30ට අඩු ගැහැණු/පිරිමි විය යුතුය.
- පාසල් අධ්‍යාපනය නිමාකල හෝ ඊට අදාල අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.
  (වසර 13ක පාසල් අධ්‍යාපනය නිමකල බවට සහතික කළ පාසල් අස්වීමේ සහතිකය හා උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය අත්‍යාවශ්‍යය.)
- පිරිමි උස 160cm ට වඩා වැඩි , බර 50kg වඩා වැඩි
- ගැහැණු උස 150cm ට වඩා වැඩි , බර 40kg වඩා වැඩි
- තනිව (පවුල් බැඳීමකින් තොරව) ජපානයේ ජීවත්විය හැකි විය යුතුය.
- සිරුරේ කිසිදු අසාමාන්‍යතාවයක් හෝ පච්චයක් නොතිබිය යුතුය.
- පාරම්පරික නිධන්ගත රෝග, බෝ නොවන රෝග, උපතේ සිට ඇති ආබාධිත තත්වයන්ගෙන් තොර විය යුතුය.
- කිසිදු අපරාධයකට සම්බන්ධ නොවූ පුද්ගලයෙකු විය යුතුය.
- දෘෂ්ඨි ආබාධ නොමැති විය යුතුය. (ඇස් කණ්ණාඩි හෝ කාච භාවිත නොකර සාමාන්‍ය දෘෂ්ඨීය = ජපාන දෘෂ්ඨි අගය 0.7 වඩා වැඩි, ශ්‍රී ලංකා දෘෂ්ඨි අගය 6/9 වඩා වැඩි , වර්ණාන්ධතාවයෙන් තොර පුද්ගලයෙකු විය යුතුය.)
- ආපසු තම රටට පැමිණීමෙන් පසු ජපානයේදී ලබාගත් දැනුම ප්‍රයෝජනයට ගනිමින් තම රටේ දියුණුව සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයෙකු විය යුතුය.

සාත්තු සේවිකා තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභී අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු විශේෂ සුදුසුකම්.

- ජපන් භාෂා ප්‍රවීණතා විභාගයේ 4 මට්ටම හෝ ඊට සමාන විභාගයකින් සමත්වී තිබීම. (උදාහරණ : JLPT N4 , NAT - TEST LEVEL 4 , JFT-Basic)
- අවුරුදු 18ට වැඩි 30ට අඩු ගැහැණු විය යුතුය.

※මෙම වැඩසටහනට සහභාගී වීමට බලාපොරොත්තුවන්නන් විසින් පහත දැක්වෙන වියදම් දැරිය යුතුය.
(ශ්‍රී ලංකාවෙන් පිටත් වීමට පෙර)

- ජපානයේ තාක්ෂණ පුහුණුව සඳහා ඉල්ලුම් කිරීමේ අවස්ථාවේ සිට ශ්‍රී ලංකාවෙන් පිටත් ව යාමට ප්‍රථමයෙන් සහභාගී වන පෙර පුහුණු වැඩමුළු පැවැත්වෙන මධ්‍යස්ථානය දක්වා වන රට අභ්‍යන්තරයේ ප්‍රවාහන වියදම්.
- සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණ සහ එම සෞඛ්‍ය වෛද්‍ය වාර්තාවන් ලබාගැනීම සඳහා දැරිය යුතු වියදම්.(පුහුණු මධ්‍යස්ථානයට ඇතුල්වීමට පෙර හා ජපානයට පිටත් වීමට පෙර යන අවස්ථා දෙකේදී)
- බෝවන රෝග පාලනය කිරීම සඳහා එන්නත් ලබා ගැනීමට යන වියදම්.
- ජපානයේ තාක්ෂණ පුහුණු වැඩසටහන ට ඉල්ලුම් කිරීමේදී අවශ්‍ය වන ලියකියවිලි සකස් කිරීම සඳහා වැයවන වියදම්.
- විදේශ ගමන් බලපත්‍රය ලබාගැනීම සඳහා වැයවන වියදම්.
- ජපන් වීසා ඉල්ලුම් කිරීමට අවශ්‍ය වියදම්.
- පෙර පුහුණු වැඩමුළු පැවැත්වෙන කාලය අතරතුර ආහාරපාන සඳහා වැයවන වියදම්.
- විදේශ ගතවීමේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තු.
- පෙර විගමනික පුහුණුවට සහභාගී වීමේදී අවශ්‍යවන පොත් පත්, ලිපි ද්‍රව්‍ය, ඇඳුම් පැළඳුම් හා එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වන පිරිවැය.

# බඳවාගැනීම් පරීක්ෂණයේ ක්‍රියාපටිපාටිය.

1. ලියාපදිංචි කිරීම හා ලිපි ලේඛන පරීක්ෂා කිරීම.
2. ශරීර ප්‍රමාණය (**පච්ච, ශරීර අසාමාන්‍යතා නොතිබිය යුතුය**)
   - පිරිමි… උස 160 වඩා වැඩි, බර 50kg වඩා වැඩි
   - ගැහැණු… උස 150 වඩා වැඩි, බර 40kg වඩා වැඩි
3. දැනුම පරීක්ෂණය
   - සාමාන්‍ය රැකියා සඳහා: ①ගණිත පරීක්ෂණය 1 හා ගණිත පරීක්ෂණය **2** (4 වසර සිට 8 වසර දක්වා වන ගණිත ගැටළු )
     ②ජපන් භාෂා පරීක්ෂණය
     (ජපන් භාෂා ප්‍රවීනතා විභාගයෙහි N5 මට්ටම, හිරගනා / කතකනා පරීක්ෂණය)
     ③IM JAPAN වැඩසටහන පිළිබඳ දැනුම පරීක්ෂණය
   - සාත්තුසේවය සඳහා: ①ගණිත පරීක්ෂණය 1 හා ගණිත පරීක්ෂණය **2** (4 වසර සිට 8 වසර දක්වා වන ගණිත ගැටළු )
     ②ජපන් භාෂා පරීක්ෂණය
     ( ජපන් භාෂා ප්‍රවීනතා විභාගයෙහි N4 මට්ටම, හිරගනා / කතකනා පරීක්ෂණය)
     ③IM JAPAN වැඩසටහන පිළිබඳ දැනුම පරීක්ෂණය
4. ශාරීරික අභ්‍යාස පරීක්ෂණය
   - පිරිමි… දිවීම : 3km විනාඩි 15 ඇතුලත, Push-ups: නොනවත්වා වාර 35ක්, Sit-ups නොනවත්වා වාර 25ක්
   - ගැහැණු … දිවීම : 1.5 k m විනාඩි 10 ඇතුලත, Push-ups නොනවත්වා වාර 15ක්, Sit-ups නොනවත්වා වාර 15ක්







5. සම්මුඛ පරීක්ෂණය
6. සෞඛ්‍ය පරීක්ෂණය
7. දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන

# Math Test(1st)-(Sample)

| | | |
|---|---|---|
| No. | JP_____( ) | 8 min. |
| Name with Initials | | |
| Signature | | |

※කටුවැඩ සඳහා මෙම කොලයෙ හි කිසිවක් ලියා නොමැති ඉතිරි ඉඩ ප්‍රමාණය භාවිතයට ගන්න. අත ,මේසය ,වෙනත් කොල ආදියෙහි කටුවැඩ කිරීම තහනම් වේ.

| | | |
|---|---|---|
| Sample 1 | 10 ＋ 2 ＝ | ( 12 ) |
| Sample 2 | 1 day ＝ | ( 24 ) hours |
| 1 | 54 ＋ 87 ＝ | ( ) |
| 2 | 243 － 25 ＝ | ( ) |
| 3 | 4 × 23 ＝ | ( ) |
| 4 | 186 ÷ 6 ＝ | ( ) |
| 5 | 8cm ＝ | ( ) mm |
| 6 | 4m ＝ | ( ) cm |
| 7 | 9km ＝ | ( ) m |
| 8 | 7kg ＝ | ( ) g |
| 9 | 3t ＝ | ( ) kg |
| 10 | 5ℓ ＝ | ( ) mℓ |
| 11 | 2 minutes ＝ | ( ) seconds |
| 12 | 1.5 hours ＝ | ( ) minutes |
| 13 | 3 weeks ＝ | ( ) days |
| 14 | $3^2$ | ( ) |
| 15 | $\sqrt{4}$ ＝ | ( ) |
| 16 | 0.3 － 0.2 ＝ | ( ) |
| 17 | 2.1 ＋ 0.01 ＝ | ( ) |
| 18 | 0.2 × 10 ＝ | ( ) |
| 19 | 1／3 ＋ 2／3 | ( ) |
| 20 | 1／4 ＝ | ( ) % |

# Hiragana & Katakana Test(Sample)

| | | |
|---|---|---|
| No. | JP ( ) | |
| Name with Initials | | |
| Signature | | 10 min. |

HIRAGANA

| | | | | |
|---|---|---|---|---|
| a あ | I い | u う | e え | o お |
| ka か | ki き | ku く | ke け | ko こ |
| sa さ | shi し | su す | se せ | so そ |
| ta た | chi ち | tsu つ | te て | to と |
| na な | ni に | nu ぬ | ne ね | no の |
| ha は | hi ひ | fu ふ | he へ | ho ほ |
| ma ま | mi み | mu む | me め | mo も |
| ya や | | yu ゆ | | yo よ |
| ra ら | ri り | ru る | re れ | ro ろ |
| wa わ | | wo を | | n ん |





KATAKANA



| | | | | |
|---|---|---|---|---|
| a ア | I イ | u ウ | e エ | o オ |
| ka カ | ki キ | ku ク | ke ケ | ko コ |
| sa サ | shi シ | su ス | se セ | so ソ |
| ta タ | chi チ | tsu ツ | te テ | to ト |
| na ナ | ni ニ | nu ヌ | ne ネ | no ノ |
| ha ハ | hi ヒ | fu フ | he ヘ | ho ホ |
| ma マ | mi ミ | mu ム | me メ | mo モ |
| ya ヤ | | yu ユ | | yo ヨ |
| ra ラ | ri リ | ru ル | re レ | ro ロ |
| wa ワ | | wo ヲ | | n ン |

| No. | JP＿＿＿＿( ) | 20 min |
|---|---|---|
| Name with Initials | | Signature : |

# Math Test-2nd(Sample)

MATH TEST ① ↓මෙම කොටස කටු වැඩ සඳහා භාවිතා කරන්න.

| | | |
|---|---|---|
| 1 | 429+651= | |
| 2 | 2564-1246= | |
| 3 | 28x36= | |
| 4 | 1398÷8= | |
| 5 | 1/2+ 2/8 = | |
| 6 | 1/4 – 1/2 = | |
| 7 | 0.2x0.8= | |
| 8 | What is the average of 54,87,92,46<br>සාමාන්‍යය කීයද? | |
| 9 | 5xC=40 C= | |
| 10 | If 80 people took a test and only 56 people passed. What is the pass rate?<br>80 දෙනෙකු විභාගයකට මුහුණ දී ඔවුන්ගෙන් 56 පමණක් සමත් වූවේ නම් සමත් වූ ප්‍රතිශතය කීයද? | |
| 11 |  | |
| 12 | Area වර්ගඵලය<br> | |
| 13 | Area වර්ගඵලය<br> | |
| 14 | Area වර්ගඵලය $\pi$=3<br> | |

| | | |
|---|---|---|
| 15 | Volume පරිමාව   | |
| 16 | Circumference පරිධිය $\pi = 3$   | |

17) You are buying a shampoo at a shop. One bottle is Rs. 312.00 Today, items are 11% off. If you buy 5 bottles of shampoo how much do you have to pay?

ඔබ සාප්පුවකින් ෂැම්පු මිලදී ගනිමින් සිටී. එක් බෝතලයක මිල රුපියල් 312කි. අද දිනයේ එක් භාණ්ඩයකට 11%ක වට්ටමක් ලැබේ. ඔබ ෂැම්පු බෝතල් 5ක් මිලදී ගන්නේ නම් කොපමණ මුදලක් ගෙවිය යුතුද?

18) You are working at machining factory. You are told to cut a 12.5 meter steel pipe equally into 3 pieces. How long is one piece?

ඔබ වැඩ කරන්නේ යන්ත්‍රෝපකරණ කර්මාන්ත ශාලාවකයි. මීටර 12.5ක් දිග වානේ නලයක් සමාන කොටස් 3 කට කපා ගැනීමට ඔබට කියනු ලැබේ.එක් කොටසක දිග කොපමණද?

19) Flour 1kg = Rs.186 / Tomatoes 1kg = Rs .115

Your mother bought 8 kilos of flour and 6 kilograms of tomatoes. How much did your mother spend?

ඔබේ මව කිලෝග්‍රෑම් 8 ක පිටි සහ තක්කාලි කිලෝග්‍රෑම් 6 ක් මිලදී ගත්තාය. ඔබේ මව වියදම් කළ මුදල කීයද?

20) Your occupation is Painting. You are told to mix the thinner into original solution to make 5.8 liters of paint. You are given 3.4 liter of thinner. How many liters of original solution do you need?

ඔබේ රැකියාව පින්තාරු කිරීමයි. තනුක කරගත් තීන්ත ලීටර 5.8 ක් සාදා ගැනීමට ඔබට කියනු ලැබේ.ඔබට තීන්ත ලීටර 3.4 ලබාදෙනු ලැබේ. තනුක කිරීමට තිනර් ලීටර් කීයක් අවශ්‍යද?